කොවිඩ් ව්‍යාප්තිය

දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின



සාර භූමියේ හරිතාභාන්දය
අද පත්‍රය සමග

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ ඉල් පුර එකොළොස්වක ලත් බුධ දින | කාණ්ඩය 111 | පත්‍රය 293 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 නොවැම්බර් 25 බදාදා

යුද හමුදා බුද්ධි අංශයෙන් අබ පියල්ලක් තරම්වත් තොරතුරු ලැබුණේ නෑ

පාස්කු දා ප්‍රහාරයේ වගකීම බාරගන්න මට බැ

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනපති කොමිසම හමුවේ

ව්‍යාජ ඩොලර් සියයේ නෝට්ටු 372ක් සමඟ දෙදෙනෙක් කන්තලේදී දැලේ

පිට 06

...ය පුරා ...ය ...ෝනා ...යිරස්"

පිට 06

CLICK

සුභාෂිණී සේනානායක

පාස්කු ප්‍රහාරයේ වගකීම තමන් සාමූහිකව හෝ භාරගැනීමට සූදානම් නැතැයි ද එම වගකීම මෙරට සිටින සියලුම බුද්ධි අංශ භාර ගත යුතු බව ද හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පාස්කු ප්‍රහාරය පිළිබඳ සොයා බැලෙන ජනාධිපති පරීක්ෂණ කොමිසම හමුවේ කියා සිටියේය.

යළි ගෙන්වා ගැනීමේදී මැදපෙරදිග සිටින ශ්‍රී ලාංකිකයන්ට පුමුඛත්වය දෙනවා

පිට 06

පාසල් දරුවන්ගේ අධ්‍යාපනය සාර්ථක කර ගන්න සැවොම සහාය දෙන්න

පිට 06

කොමිෂන් සභා ගැන පාර්ලිමේන්තුවේ කතා කළ නොහැකියි

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර සහ සන්ධ්‍යා කරුණාරත්න

කොමිෂන් සභාවලට සාමාජිකයන් පත්කිරීමේ අයිතිය ජනාධිපතිවරයා සතු බවත් කොමිෂන් සභා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී කතා කළ නොහැකි බවත් කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (24) ප්‍රකාශ කළේය.

පිට 06

වාරි ව්‍යාපෘතිවලට ඉඩම් ගැනීමේදී ව්‍යාපෘතිය ආරම්භයට පෙර වන්දි දෙන්න

පිට 06

වසර පුරා කොවිඩ් පැවැතියත් අපරාධ නඩු ගොනු 9688ක වැඩ අවසන්

නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිනී

කුමුදු හෙට්ටිආරච්චි

වසර පුරා පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේදීත් නීතිපතිවරයාගේ මෙහෙයවීමෙන් එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අපරාධ නඩු ගොනු 9688ක වැඩ අවසන් කර ඇති බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිනී රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය පැවසුවාය.

පිට 06

වත්මන් ආණ්ඩුව වනාන්තර විනාශ කළා

ශිරෝමි අබයසිංහ

වත්මන් ආණ්ඩුව බලයට පත් වූ දා පටන් වනාන්තර විශාල ප්‍රමාණයක් විනාශ කරමින්, තවත් අක්කර ලක්ෂ ගණනක් විනාශ කිරීම සඳහා සැලසුම් කරමින් සිටින බව එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා පවසයි.

පිට 06

ජනපතිට උසාවි එන්න කියූ නියෝගය බල රහිත කරයි

නෙල්කා මැදගෙදර

යාපනය ප්‍රදේශයේ සිවිල් ක්‍රියාකාරීන් දෙදෙනකු වන ලලිත් වීරරාජ් හා කුගන් මුරුගානන්දන් 2011 වසරේදී පැහැරගෙන ගොස් අතුරුදන් කර වීම සම්බන්ධයෙන් පැවැත්වෙන නඩු විභාගයක සාක්ෂි දීම සඳහා අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට දන්වමින් යාපනය මහේස්ත්‍රාත් අධිකරණය මගින් නිකුත් කර තිබූ සිතාසිය බල රහිත කරමින් අභියාචනාධිකරණය ඊයේ (24) රිට් ආඥාවක් නිකුත් කළේය.

පිට 06

ඉවතලන මුව ආවරණ කහ පාට බෑගයකට දමන්න

වසංගත රෝග විද්‍යා අංශයේ වෛද්‍ය සුදත් සමරවීර

පිට 06

මන්ත්‍රී ධුරය සුදුසුම ගාල්ලට

පිට 06

'ද්‍රෝහීන් පලවා හැර විදේශ ආක්‍රමණවලින් රට බේරා ගනිමු'

උද්ධමනය පහළට

පිල්ලෙයාන්ට ඇප

'මහාවීර්' නවත්වන්න අධිකරණ

බන්ධනාගාරවල කොරෝනා මඬින්න මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සහාය

බුද්ධිකා ඉඹුලාන

බන්ධනාගාර පද්ධතිය තුළ කොරෝනා පැතිරීම මර්දනය කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සහාය ගැනීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත.

පිට 06